සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4th floor, **Sethsiripaya ,Battaramulla**

මගේ අංකය / எனது இல / My No } DDD/HO/MF/05/02/20 ..... වි.තො.

ඔබේ අංකය / உமது இல / Your No } .....

දිනය / திகதி / Date } 2016/12/15 .....

දිවිනැගුම බැංකු චක්‍රලේඛ අංක :- 2016/10

සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමනාකරුවන් වෙත,

**<u>දිවිනැගුම ප්‍රජාමූල බැංකු මගින් ලබාදුන්, දැනට බොල්ණය සණයට මාරුකල ණය මුදල ආපසු අයකර ගැනීමට, පොලී සහනයක් ලබාදීම.</u>**

## 01. හැඳින්වීම

1996 සිට අද දක්වා, බැංකු මගින් ලබාදුන් ණය වලින්, ණයකරුවන් හිතාමතා පැහැර හැර බොල්ණය බවට පත් වී ඇති ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍යව ඇත. ඒ සඳහා ණයකරුවන්ට ණය සහනයක් ලබාදෙන ලෙස බැංකු මෙන්ම, ණය කරුවන් ද අප වෙතින් ඉල්ලා ඇත.

මෙම සහනය ලබාදීමේ දී පහත අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කරමි.

i. දිවිනැගුම ප්‍රජාමූල බැංකු වල අක්‍රීය (බොල්ණය) ණය සණයට මාරුකර ඇති ණය, සක්‍රීය ණය බවට පත්කිරිම.

ii. ණය මුදලක් සඳහා ඇප වී, දැනට බොල්ණය බවට පත්වීම හේතුවෙන් කණ්ඩායමේ අනිකුත් පාර්ශව වලට ණය ගැනීමට නොහැකි වීම්, එම බැඳීම් වලින් මෙම කණ්ඩායම් සාමාජිකයින් නිදහස් කිරිම.

iii. අතීතයේ දී, මොනයම් හේතුවක් මත, ණය මුදල් නොගෙවා සිටිය දී, යම් සහනයක් මත ණය මුදල ආපසු ගෙවීමට උනන්දු වන සාමාජිකයින්ට ණය ගෙවීමට අවස්ථාව ලබාදීම.

iv. බැංකු මගින්, නෛතික ක්‍රියාමාර්ග වලට එළඹි බොල්ණය මුදල් අයකර ගැනීමට කටයුතු කිරීමේ දී, අධික පිරිවැයක් මෙන්ම දිගුකාලයක් ගතවන බැවින්, එම තත්ත්වයෙන් මිදීමට මෙන්ම ණයකරුවන් පීඩනයෙන් ගලවා ගැනීම.

## 02. බොල්ණය අයකර ගැනීමට ලබාදෙන සහනය

02.1. දැනටමත් බොල්ණය සණයට මාරුකර ඇති ණය වල, ගිවිසුම් ගත වාර්ෂික පොලිය 10% ට වැඩි අනුපාතයකට බැදි ලබාගත් ණය, මෙම වැඩසටහන යටතේ සහන ලැබීමට සුදුසුකම් ලබයි.

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722(Hotline)** |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | **Desktop - Ruvini** |

02.2. එහි දී, බොල්ණය කරුවන්ට ණය මුදල ආපසු ගෙවීමේ දී, 10% වාර්ෂික පොලී අනුපාතයට පොලී ගණනය කර, එම පොලිය සමඟ ණය මුදල ආපසු ගෙවීම කල යුතුය. (නිවාස ණය මුදල් ද ඇතුලත්ව)

02.3. ව්‍යාජ හෝ සේවක අක්‍රමිකතා සහිත ණය මුදල් සඳහා මෙම සහනය කිසිදු අයුරකින් වලංගු නොවේ.

## 03. පොලී සහනය ලබාදෙන, බොල්ණය වල ආයු කාලය

03.1. 2016 නොවැම්බර් මස 10 දිනට අවු. 05 ක් හෝ ඊට වැඩි ආයුකාලයක් සහිත බොල්ණය සඳහා ඡේද අංක 2.0 හි සහනය සඳහා සුදුසුකම් ලබයි.

03.2. දිවිනැගුම ප්‍රජාමූල බැංකුවෙහි නොසැලකිල්ල, අතපසුවීමකින් බොල්ණය සණයට මාරු කිරීම ප්‍රමාද කර ඇති විටක, ණය මුදල පැහැර හැරි දින සිට 2016.11.10 දින වනවිට, අවු. 05 හෝ ඊට වැඩි කාලයක් සහිත බොල්ණය සඳහා ද වාර්ෂික 10% පොලී අනුපාතයට පොලී ගැලපීමට ඉඩදෙනු ලැබේ.

## 04. වර්තමාන පොලී අනුපාතයට ගැලපීමට ඉඩදෙනු ලබන කාලය

04.1. 2016.12.15 දින සිට උපරිම මාස 18 ක් ඇතුලත එක් එක් බොල්ණය මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කල යුතුය.

04.2. බොල්ණය මුදල අනුව, පහත කාලයන් තුල ගෙවීමට ඉඩදෙනු ලැබේ.

| පිටහිටි ණය මුදලෙහි වටිනාකම (රු.) | ආපසු ගෙවීමට ඉඩ දෙනු ලබන කාලය (මාස) |
|---|---|
| රු. 5,000 ක් හෝ ඊට අඩු | 06 |
| රු. 5,001 සිට රු. 10,000 දක්වා | 12 |
| රු. 10,001 සිට ඉහලට | 18 |

04.3. ණයකරුගේ ඉල්ලීම මත උපරිම කාලය අඩු කර, ආපසු ගෙවීමට ඉඩදිය හැක.

## 05. වර්තමාන වාර්ෂික පොලී අනුපාතයට පොලී ගණනය හා ආපසු ගෙවීම.

05.1. දැනට,බොල්ණය අයකරගැනීමේ ක්‍රමවේදය අනුව, වාරික හා පොලී මුදල අයකර ගැනීම හා සටහන් තැබීම සිදුකල යුතුය.

05.2. මෙහිදී, පළමුව පොලී මුදලත්, ඉන් අනතුරුව ණය මුදලෙහි වාරිකය අයකර ගැනීමේ සම්මත ක්‍රමවේදය කිසිදු අයුරකින් වෙනස් නොවේ.

05.3. පිටහිටි බොල්ණය මුදලෙහි මාසික වාරිකය සකසා ගැනීම, ඡේද අංක 4.02 අනුව, ඔහු / ඇයට ලබාදෙන ණය ආපසු ගෙවීමට ලබාදෙන කාලය අනුව, පිටහිටි ණය මුදල, ලබාදෙන කාලයෙන් බෙදා වාරික මුදල සොයා ගත යුතුය.

05.4. මෙම ක්‍රමවේදයන් භාවිත කර ණය මුදල ආපසු ගෙවීමේ දී, ගිවිසුම් ගත කාලය, වාරික මුදල වෙනස් වන අතර, නව කාලය, මුදල භාවිතා කල යුතුය.

05.5. දැනටමත් අත්සන් කරන ලද ගිවිසුම් සංශෝධනයකින් තොරව පාවිච්චි කල යුතුය. නව වෙනස්කම් පෞද්ගලික ලෙජර්, ණය කාඩ් පතෙහි හා පාස් පොතෙහි පමණක් නිවැරදි කර පවත්වා ගෙන යා යුතුය.

05.6. ණය මුදල ගෙවීමට ලබාදෙන නව ක්‍රමවේදය කිසිදු අයුරකින් ණය ප්‍රතිලේඛන ගත කිරීමටත් නොවන බව අවධාරණය කරමු.

## 06. පොලී සහනය ලබාදීමට බැංකු මට්ටමින් විමර්ශන කමිටුවක් පත්කිරීම.

06.1. කමිටු සංයුතිය

I. කළමනාකරු - දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතිය (සභාපති)

II. මූලස්ථාන කළමනාකරු - සාමාජික

III. බැංකු කළමනාකරු - ලේකම්

IV. කලාප සහකාර - සාමාජික

V. පාලක මණ්ඩල සභාපති - සාමාජික

06.2. වාර්ෂික 10% පොලී අනුපාතයට අනුව, පොලී සහනය ලබාදීම සඳහා බොල්ණයකරුවන් හඳුනාගැනීම මෙම කමිටුව මඟින් අනිවාර්යෙන් සිදුකල යුතුය. එහි දී, එක් එක් ණයකරු විමර්ශන කමිටුවට පෞද්ගලිකව කැඳවිය යුතුය. එහි දී, පහත කරුණු සොයාබැලිය යුතුය.

I. නිදහස් කල ණය මුදල හා දැනට පිටහිටි ණය මුදලේ වටිනාකම (රු.)

II. ණය මුදල නිදහස් කල දිනය

III. වාර්ෂික පොලී අනුපාතය

IV. ණය මුදල නිවැරදි ලෙස, මෙම ණයකරු වෙත ලබා දී ඇත් ද යන්න හෝ යම් අක්‍රමිකතාවක් සිදු වී ඇත්ද යන්න නිශ්චය කර ගත යුතුය.

V. ණය මුදල ආපසු ගෙවීමට ඉල්ලුම් කරන කාලය හා කමිටුව විසින් ලබාදෙන කාලය

VI. විමර්ශන කමිටුව මඟින් ලබාගත් තීරණය

06.3. මෙම කමිටුව විසින් සොයා ගන්නා තීන්දු, බැංකු කළමනාකරුවන් විසින් එක් එක් ණයකරු සම්බන්ධව තොරතුරු ලිඛිතව පවත්වාගෙන යා යුතුය. ඒ සඳහා ගොනුවක් හෝ CR පොතක් භාවිතා කල යුතුය.

06.4. එක් එක් ණයකරු පිළිබඳ සොයා බැලීමේ දී, යම් විෂමතාවයක් හෝ අක්‍රමිකතාවක් සොයා ගත හැකි වූ විට, මේ සම්බන්ධව දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත වාර්තා කල යුතුය.

## 07. අනෙකුත් කරුණු

07.1. ආපසු අයකරගත් ණය මුදල්, ලද ආදායම් බොල්ණය ආපසු අයකරගැනීමේ ගිණුමට හා අනිකුත් ගිණුම් තුලනය දැනමටත් දී ඇති උපදෙස් පරිදි සිදුකල යුතුය.

07.2. මෙම සහන වැඩසටහන යටතේ ද, බොල්ණය කරුවන් ණය මුදල ආපසු ගෙවා නිදහස් වීමට කටයුතු නොකරන්නේ නම්, ඔවුන් සම්බන්ධ ඉදිරියේ නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.

07.3. මෙම උපදෙස් පරිදි ණය මුදල ගෙවා අවසන් කරන, සාමාජිකයන් විසින් බැංකු ණය වැඩසටහන යටතේ නව ණය ඉල්ලුම් කරන අවස්ථාවක, රු. 50,000/- ට නොඅඩු ණය මුදලක් පළමු අවස්ථාවේ දී, දැනටමත් ක්‍රියාත්මක ඇප මත දිය හැක. එහි දී, ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා ණය ලබාදීමට කටයුතු කිරීම අනිවාර්ය වේ.

07.4. මෙම උපදෙස් වලට අනුකූලව ණයමුදල් අයකර ගැනීමට බැංකු / බැංකු සමිති කළමනාකරුවන් හා කාර්යය මණ්ඩල කටයුතු කල යුතුය. මේ සම්බන්ධ ක්‍රියා නොකර, ඉන් අනතුරුව යම් යම් සහන ඉල්ලා එවන ඉල්ලීම් සඳහා ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින්, ක්‍රියා නොකරන බවට දන්වමි.

07.5. 2018.06.15 දිනට වර්තමාන 10% පොලියට ගලපා ණය මුදල අයකර ගැනීමට ලබාදුන් කාලය අවසන් වන අතර, එදිනට මෙම සහනය ලබාදුන් එක් එක් ණය වල මුළු මුදල අයකර තිබිය යුතුය. එදින සිට යම් ශේෂයක් තවදුරටත් ඇති විටක මුල් ණය ගිවිසුමේ සඳහන් පොලී අනුපාතය අනුව පොලිය ගණනය කල යුතු බව ද අවධාරණය කරමු.

07.6. දැනටමත් බොල්ණය ලෙස හඳුනාගෙන, වෙන්කර ඇති බැවින් ණය සංරක්ෂණ, සමූහ සංරක්ෂණ ප්‍රතිලාභ සඳහා කිසිදු හිමිකමක් නොමැත.

**නීල් හපුහින්න,**

**අධ්‍යක්ෂ ජනරාල්.**

**පිටපත් :-**

01. ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ස.
02. දිස්ත්‍රික් ලේකම්වරුන් / අතිරේක දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල්, - කා.දැ.ස.
    දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.
03. සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - දැ.ස.
04. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - දැ.ස.
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක,දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
06. සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරුවන් - අ.ක.ස.